අපි රෝස, සමන් පිච්ච, ඉද්ද, අරලිය, ඕළු මල් වලින් බුදුන් පුදමු

අපි බෝ ගස, චෛත්‍යය, බුදු පිළිමය මලින් පුදමු

අපි මැටි පහන් , හඳුන් කූරු පත්තු කරමු

සාධු සාධු සාධු අපි ගාථා කියමු

හාමුදුරුවෝ බණ කියා, සෙත් පිරිත් ගායනා කරයි

අපි ධර්ම ශාලාවේ ඉඳ භාවනා කරමු

හාමුදුරුවෝ වැඩ සිටින්නේ ආවාස ගෙදරය

හාමුදුරුවන්ට දන් දීම, පිරිකර පිරිනැමීම පිනකි

වෙසක් පෝය දා

1. සිදුහත් කුමරු , ලුම්බිණි සල් උයනේ , උපන්නා
2. බෝධිසත්වයෝ , බුද්ධ ගයාවේ බෝ ගසක් යට , බුදුබව ලැබුවා
3. බුදු හිමි, කුසිනාරාවේ උපවත්තන සල් උයනේ, පිරිනිවන් පෑවා

සිදුහත් කුමරුගේ මව – මහමායා දේවියයි
සිදුහත් කුමරුගේ පියා – සුද්දෝධන රජතුමායි

සිදුහත් කුමරුගේ නම් තැබීමේ උළෙලට පැමිණි කොණ්ඩඤ්ඤ බමුණා, කුමරු අනිවාර්‍යයෙන්ම බුදුවන බව ප්‍රකාශ කර, "සිද්ධාර්ථ ගෞතම" යන නම තැබුහ.

බුදු බවට පෙර බෝධිසත්වයන්ට උපකාර කල පස්වග මහණුන් – කොණ්ඩඤ්ඤ , බද්දිය , වප්ප , මහානාම , අස්සජි

බුදු හිමි ලංකාවේ මහිඅංගනය, නාගදීපය, කැලණිය යන තැන්වලට වැඩම කලහ.

හේමමාලා කුමරිය සහ දන්ත කුමරු, බුදුහිමිගේ දන්ත ධාතු රැගෙන ලංකාවට පැමිණියහ. මහනුවර දළදා මාලිගාවේ එම දන්ත ධාතු තැන්පත් කර ඇත

වෙසක් දවසට බෞද්ධයෝ –
- වෙසක් කූඩු හදති
- දන්සැල් පවත්වති
- තොරණ් හදති

පොසොන් පෝයදා –
ඉන්දියාවේ ධර්මාශෝක රජතුමාගේ පුතා මිහිඳු
දුව සංඝමිත්තා
එකල ලංකාවෙ රජු වූයේ – දේවානම්පියතිස්ස රජ
අගනගරය – අනුරාධපුරය
මිහිඳු මහරහතන් වහන්සේ, පොසොන් පෝයදා මිහින්තලයට වැඩම කළා

පසුව සංඝමිත්තා තෙරණිය, බොධී ශාඛාවක් ලංකාවට ගෙන ආවා